# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2071/3 - 2018 මැයි මස 14 වැනි සඳුදා - 2018.05.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 7/2001(III)

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) නියෝගවල 19(1) වන නියෝගය යටතේ වූ නියමය

2017 ඔක්තෝබර් මස 06 වැනි දින අංක 2039/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) නියෝගවල කාර්යය සඳහා පත් කරන ලද නිසි බලධාරයා වන කපිල මුදන්ත වෛද්‍යරත්න වන මම, ඉහත කී නියෝගවල 19(1) වන නියෝගය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරමින් මේ නියමය මගින්, ඉහත කී නියෝගවල 19(3) වන නියෝගය යටතේ නම්කර ඇති සහ ලැයිස්තුගත කර ඇති සහ 2018 අප්‍රේල් මස 19 වැනි දින 2067/14 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද යම් තැනැත්තකු සහ ආස්ථිත්‍යයක් විසින් හෝ එවැනි නම් කළ තැනැත්තකු සහ ආස්ථිත්‍යයක් සඳහා, එවැනි නම් කළ තැනැත්තකු සහ ආස්ථිත්‍යයක් වෙනුවෙන් හෝ එහි විධානය යටතේ ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තකු සහ ආස්ථිත්‍යයන් විසින් සෘජුව හෝ වක්‍රව අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන ශ්‍රී ලංකාවේ පවතින සියලු අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් මේ නියමය මගින් ක්‍රියා විරහිත කරමි.

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
නිසි බලධරයා,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 මැයි මස 11 වැනි දින,
කොළඹ දී ය.

06-09

1A - G 27616 — 32 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*